FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2022 දෙසැම්බර්

2 වන වෙළුම - කලාප අංක 12


ගල්වැව සිරිධම්ම හිමිට ඇප


ඩිලාන් සේනානායකට මැර ප්‍රහාරයක්


වෛද්‍ය චමල් සංජීවගේ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 14ක් 2022 දෙසැම්බර් මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 07ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 05ක්, ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ සිදුවීම් 01ක් සහ වෘත්තීයවේදීත්වයට අදාළ සිදුවීම් 01ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. ගල්වැව සිරිධම්ම හිමි වෙනුවෙන් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ කැඳවනු ලැබීම.
2. වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමියන්ට කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප නියම කිරීම.
3. ජාත්‍යන්තර මානව හිමිකම් දිනය නිමිත්තෙන් සංවිධානය කළ වැඩසටහනක් වෙනුවෙන් වෙන් කර තිබූ ශාලාව ලබා නොදීමට BMICH බලධාරීන් කටයුතු කිරීම.
4. ගෝල්ෆේස් අරගලයට පහරදීමට එරෙහි මූලික අයිතිවාසිකම් පෙත්සම් 5ක් විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කිරීම.
5. වෛද්‍ය චමල් සංජීව ගේ වැඩ තහනම පිළිබඳ පරීක්ෂණයට පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාවක් පත් කිරීම.
6. වසන්ත මුදලිගේ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීම.
7. ජනමාධ්‍යයට කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් වැඩ තහනමට ලක් වූ වෛද්‍ය චමල් සංජීවගේ මූලික අයිතිවාසිකම්

පෙත්සම විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කිරීම.

8. සමාජ මාධ්‍ය ක්‍රියාකාරී ඩිලාන් සේනානායකට නාඳුනන පුද්ගලයන්ගේ ප්‍රහාරයකින් බරපතළ තුවාල සිදු වීම.

9. ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ මනෝජ් මුදලිගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.

10. මාධ්‍යවේදී කනපතිපිල්ලෙයි කුමනන් ගෙන් පොලිසිය ප්‍රකාශයක් ලබා ගැනීම.

11. සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන සෂික දිසානායක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම

12. මාධ්‍යවේදී සම්බසිවම් සතීස්කුමාර්ට තර්ජනය කොට රාජකාරියට බාධා කිරීම.

13. ලේක්හවුස් මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් 149 දෙනෙකු සේවයෙන් ඉවත් වීම.

14. 2022 වසරේ මහජන නැගිටීම් අතරතුර සිදු වූ මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව Right to life ආයතනය සිදු කළ අධ්‍යයනයක වාර්තාවක් එළිදැක්වීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 දෙසැම්බර්**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 07 |
| නීතිමය කොන්දේසි | 05 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 01 |
| වෘත්තීයවේදිත්වය | 01 |
| **එකතුව** | **14** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 06ක් සහ පෙර සිදුවීමකට අදාළ වර්ධනයක් දෙසැම්බර් මාසයේදී නිරීක්ෂණය විය.**

**2 වගුව: 2022 දෙසැම්බර්: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 07**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| පහරදීම් | 01 |
| මානසික බලපෑම් | 06 |
| **එකතුව** | **07** |

01. ජාත්‍යන්තර මානව හිමිකම් දිනය නිමිත්තෙන් සංවිධානය කළ වැඩසටහනක් වෙනුවෙන් වෙන් කර තිබූ ශාලාව ලබා නොදීමට BMICH බලධාරීන් කටයුතු කිරීම.

බහුජන සංවිධාන හා වෘත්තීය සමිති ඒකාබද්ධව, දෙසැම්බර් 10 වැනිදා මෙම වැඩසටහන පැවැත්වීමට සංවිධානය කර තිබුණු අතර එහි ප්‍රධාන කථිකයන් ලෙස නීතිඥ සංගමයේ සභාපති, ජනාධිපති නීතිඥ සාලිය පීරිස් සහ මහාචාර්ය අර්ජුන පරාක්‍රම සහභාගි වීමට නියමිතව තිබිණි. සියලු ගාස්තු ගෙවා වෙන් කර තිබූ ශාලාව ලබා නොදීමේ තීරණය සංවිධායකයින් වෙත දැනුම් දෙන ලද්දේ දෙසැ. 08 වැනිදාය. මේ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක්

ඉදිරිපත් කර ඇත. පසුව මෙම රැස්වීම ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී සාර්ථක ලෙස පවත්වන ලදි.'රාජ්‍ය මර්දනයට විරෙහිව මහජනයාගේ සටන් කිරීමේ අයිතිය' එහිදී අවධාරණය කෙරිණි.

මූලාශ්‍රය: 1. https://www.facebook.com/uduwaragedara
2. https://twitter.com/JDSLanka

02. **වෛද්‍ය චමල් සංජීව ගේ වැඩ තහනම පිළිබඳ පරීක්ෂණයට පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාවක් පත් කිරීම.**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්දපෝෂණය සම්බන්ධයෙන් සිදුකරන ලද ප්‍රකාශ සහ සෞඛ්‍ය අමාත්‍යාංශය හා සෞඛ්‍ය ප්‍රතිපත්තිවල පවතින අඩුපාඩු පිළිබඳව පළ කළ අදහස් වලින් සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රතිරූපයට හානි වී ඇතැයි යන පදනම මත වෛද්‍ය චමල් සංජීව වැඩ තහනමට ලක්ව සිටී. මෙම වැඩ තහනම සම්බන්ධව විශේෂ පෙත්සම් කාරක සභාවක් පත් කොට පරීක්ෂණයක් පැවැත්වීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කතානායකවරයා තීරණය කොට ඇත.

මූලාශ්‍රය: https://wedabima.lk/union-news

03. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරී ඩිලාන් සේනානායකට නාඳුනන පුද්ගලයන්ගේ ප්‍රහාරයකින් බරපතළ තුවාල සිදු වීම.**

තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් බරපතළ තුවාල ලැබූ ඔහුට කළුබෝවිල ශික්ෂණ රෝහලේදී සැත්කමක් සිදුකෙරිණි. 14 වැනිදා නුගේගොඩ පාගෙ ාඩ පාරේ පිහිටි ඔහුගේ පෞද්ගලික ශබ්දාගාරයට මුහුණු ආවරණයකරගෙන පැමිණි දෙදෙනෙකු මෙම පහරදීම සිදු කර තිබේ. අපරාධකරුවන් හඳුනාග ැනීමට පොලිසිය අපොහොසත් වී ඇත. හඬ ශිල්පියකු වන ඩිලාන් සේනානායක ගෝල්ෆේස් අරගලයේ ප්‍රමුඛ ක්‍රියාකාරිකයෙකි.

මූලාශ්‍රය: https://www.youtube.com

04. **ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ මනෝජ් මුදලිගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.**

දෙසැම්බර් 15 වැනිදා ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් පැය 5ක පමණ කාලයක් ඔහුගෙන් ප්‍රශ්න කර ඇත. අරලියගහ මන්දිරය අත්පත් කර ගැනීම ඇතුළු අරගලයේ ක්‍රියාමාර්ග සඳහා වසන්ත මුදලිගේ හා ගල්වැව සිරිධම්ම හිමියන්ගේ මෙහෙයවීමක් තිබුණේදැයි තමන්ගෙන් ප්‍රශ්න කළ බව ඔහු ප්‍රකාශ කරයි.

මූලාශ්‍රය: https://www.youtube.com

05. **මාධ්‍යවේදී කනපතිපිල්ලෙයි කුමනන් ගෙන් පොලිසිය ප්‍රකාශයක් ලබා ගැනීම.**

උතුරු පළාතේ මාධ්‍යවේදියකු වන කනපතිපිල්ලෙයි කුමනන්, දෙසැම්බර් 29 වැනිදා මුලතිවු සහකාර පොලිස් අධිකාරි කාර්යාලයට කැඳවා ප්‍රකාශයක් ලබාගෙන තිබේ. මින් පෙර අවස්ථාවක, මාධ්‍යවේදියාගේ රාජකාරියට බාධා කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් කෙරෙන විමර්ශනයකට අදාළව එම ප්‍රකාශය ලබාගෙන ඇත.

මූලාශ්‍රය: FMM-MFRM Desk

06. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන සෂික දිසානායක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම**

දෙසැම්බර් 20 වැනිදා ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා තිබුණු අතර එහිදී සිරස මාධ්‍ය ආයතනයට, ගෝල්ෆේස් අරගලය සමඟ සම්බන්ධතාවක් තිබුණේ දැයි දිගින් දිගටම ප්‍රශ්න කළ බව ඔහු ප්‍රකාශ කරයි. 'එම මාධ්‍ය ආයතනය හිර කිරීමේ අරමුණක් මේ ප්‍රශ්න කිරීම පිටුපස තිබෙන බව පෙනී යන්නේයැයි' ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: https://www.youtube.com

07. **මාධ්‍යවේදී සම්බසිවම් සතීස්කුමාර්ට තර්ජනය කොට රාජකාරියට බාධා කිරීම.**

වතු නිවාසවල පදිංචිකරුවන්ට බලපාන ජල ගැටලුවක් හේතුවෙන් ඇති වූ නොසන්සුන්තාවක් වාර්තා කිරීමේදී මඩොල්සිම වැවිලි සමාගමට අයත් බගවන්තලාව කර්ක්ස්වෝල්ඩ් වතු කළමනාකාරිත්වය සහ ශ්‍රී ලංකා කම්කරු කොංග්‍රසයේ වතු ප්‍රධානියා විසින් මෙම තර්ජනය සිදු කර තිබේ. මාධ්‍යවේදියා ඒ පිළිබඳව දෙසැම්බර් 30 වැනිදා බගවන්තලාව පොලිස් ස්ථානයට පැමිණිලි කර ඇත.

මූලාශ්‍රය: FMM-MFRM Desk

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 05ක් දෙසැම්බර් මාසය තුළ නිරීක්ෂණය විය. එයින් අවස්ථා 04ක් පෙර සිදුවීම්වල යාවත්කාලීන අවස්ථාවන් වේ.**

**3 වගුව: 2022 දෙසැම්බර්: නීතිමය කොන්දේසි - සිදුවීම් 05**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 05 |
| **එකතුව** | **05** |

01. **ගල්වැව සිරිධම්ම හිමි වෙනුවෙන් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ කැඳවනු ලැබීම.**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තැබීමෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව ප්‍රකාශ කරන්නැයි ඉල්ලමින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. බුවනෙක අළුවිහාරේ හා ජනක්ද සිල්වා යන විනිසුරුමඬුල්ල හමුවේ මෙම පෙත්සම සලකා බැලෙන අතර එය ජනවාරි 22 වැනිදා නැවත කැඳවීමට නියමිතය.

මූලාශ්‍රය: https://www.youtube.com

02. **වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමියන්ට කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප නියම කිරීම.**

උද්ඝෝෂණයකදී පොදු දේපළවලට හානි කිරීම පිළිබඳ චෝදනාවක් මත අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය හා භික්ෂු බල මණ්ඩලයේ කැඳවුම්කරුවන් වන වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමියන් දෙසැ. 06 වැනිදා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙසේ ඇප නියම කෙරිණි.

මෙහිදී ගල්වැව සිරිධම්ම හිමි ඇප මත නිදහස් වූ නමුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන සිටින වසන්ත මුදලිගේ වෙනත් නඩුවක් සම්බන්ධයෙන් ලබා දී ඇති නියෝගයක් මත තවදුරටත් බන්ධනාගාරගත කෙරිණි.

මූලාශ්‍රය: www.ada.lk

03. **ගෝල්ෆේස් අරගලයට පහරදීමට එරෙහි මූලික අයිතිවාසිකම් පෙත්සම් 5ක් විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කිරීම.**

2022 මැයි 09 වැනිදා ගෝල්ෆේස් හි කඳවුරුලාගෙන සිටි අරගලකරුවන්ට පහරදීමට එරෙහිව, එහිදී බරපතළ ලෙස තුවාල ලත් ළහිරු චානක ඇතුළු ක්‍රියාකාරිකයින් පිරිසක් විසින් මෙම පෙත්සම් ඉදිරිපත් කරන ලදි. වගඋත්තරකරුවන් ලෙස හිටපු අගමැති මහින්ද රාජපක්ෂ, ඇමතිවරුන් වන නාමල් රාජපක්ෂ, ජොන්ස්ටන් ප්‍රනාන්දු, සනත් නිශාන්ත, පොලිස්පති චන්දන වික්‍රමරත්න, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ඇතුළු පිරිසක් නම් කොට තිබේ. පෙත්සම් විභාගය ජුනි 22 වැනිදා ආරම්භ කිරීමට නියමිතය.

මූලාශ්‍රය: https://www.youtube.com

04. **වසන්ත මුදලිගේ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීම.**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටීමෙන් පසුව රක්ෂිත බන්ධනාගාරගත කර සිටින, අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ දෙසැ 12 වැනිදා කොළඹ අතිරේක මහේස්ත්‍රාත් තරංගා මහවත්ත මහත්මිය හමුවට ඉදිරිපත් කෙරිණි. එහිදී ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් අධිකරණයට ප්‍රකාශ කළේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය විසින් සිදු කරන විමර්ශනවලින් සියයට හැටක් පමණ අවසන් කර ඇති අතර ප්‍රමාදයකින් තොරව ඉදිරි විමර්ශන සිදු කරන බවයි. සැකකරුගේ ප්‍රකාශ 8-9ක් පමණ ලබාගෙන ඇති බවත් පුද්ගලයන් 1150කගේ ප්‍රකාශ ලබාගෙන ඇති බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය. සැකකරු වෙනුවෙන් පෙනීසිටි ජනාධිපති නීතිඥ සාලිය පීරිස් පෙන්වා දුන්නේ පැමිණිල්ල විසින් මෙතෙක් අධිකරණයට ඉදිරිපත් කර ඇති විමර්ශන වාර්තා අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතට ගැනෙන වැරදි කිසිවක් අනාවරණය වී නොමැති බැවින් සාමාන්‍ය නීතිය යටතේ තීරණයක් ගැනීමේ බලය අධිකරණයට ඇති බවයි.

පසුදින යළිත් අධිකරණයට ඉදිරිපත් කළ සැකකරු ජනවාරි 17 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

මූලාශ්‍රය: https://www.youtube.com

05. **ජනමාධ්‍යයට කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් වැඩ තහනමට ලක් වූ වෛද්‍ය චමල් සංජීවගේ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කිරීම.**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ළමා මන්දපෝෂණය සම්බන්ධයෙන් සිදුකළ ප්‍රකාශයක් හේතුවෙන් වැඩ

තහනමට ලක්ව සිටින වෛද්‍ය චමල් සංජීව ගොනුකළ මූලික අයිතිවාසිකම් පෙත්සමක් විභාගයට ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය දෙසැම්බර් 14 වැනිදා අවසර ලබාදුන්නේය.

වැඩතහනම අත්හිටුවමින් අතුරු නියෝගයක් නිකුත් කරන ලෙස පෙත්සමෙන් කර තිබූ ඉල්ලීම ප්‍රතික්ෂේප කෙරිණි.

මූලාශ්‍රය: https://island.lk

## ව්‍යුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන එක් සිදුවීමක් මෙහි ඇතුළත් වේ.**

**4 වගුව: 2022 දෙසැම්බර්: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 01 |
| **එකතුව** | **01** |

1. **2022 වසරේ මහජන නැගිටීම් අතරතුර සිදු වූ මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව Right to life ආයතනය සිදු කළ අධ්‍යයනයක වාර්තාවක් එළිදැක්වීම.**

   රඹුක්කන වෙඩිතැබීම, ගෝඨාගෝගම ප්‍රහාරය සහ මැයි 9 සන්ධ්‍යාකාලයේදී ඇති වූ පළිගැනීමේ ප්‍රහාර මාලාව මෙම අධ්‍යයනයට පාදක කරගෙන ඇති අතර එවැනි සිදුවීම් වැළැක්වීම සඳහා නිර්දේශද ඉදිරිපත් කර තිබේ. පොලිස් ආඥාපනත සංශෝධනය කිරීම, ස්වාධීන කොමිෂන් සභා මගින් විමර්ශන සිදු කිරීම සහ සියලු විමර්ශනවලින් හෙළි වූ තොරතුරු හා දුක්ගැනවිලි ලේඛනගත කිරීමට සත්‍ය කොමිසමක් වැනි යාන්ත්‍රණයක් ඇති කිරීම එම නිර්දේශ අතර වෙයි. දෙසැම්බර් 30 වැනිදා කොළඹ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ පැවති උත්සවයකදී මෙම වාර්තාව එළිදැක්විණි.

   අදාළ වාර්තා සඳහා සබැඳිය:
   https://www.right2lifelanka.org/publications

## වෘත්තීයවේදීත්වය

**වෘත්තීයවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධිපත්‍යය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම යන දර්ශක ඇතුළත් වේ. ඒ අතුරින් මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි හා මධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම යන දර්ශකය යටතට ගැනෙන එක් වැදගත් සිදුවීමක් නිරීක්ෂණය විය. මෙය ව්‍යහාත්මක කොන්දේසි, මාධ්‍ය නිෂ්පාදිතයන්ගේ විවිධත්වය හා ගුණාත්මකබව යන සංරචකවලටද අදාළ වේ.**

**5 වගුව: 2022 දෙසැම්බර්: වෘත්තීයවේදීත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි/ මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම | 01 |
| **එකතුව** | **01** |

01. ලේක්හවුස් මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් 149 දෙනෙකු සේවයෙන් ඉවත් වීම.

රජයට අයත් ලේක්හවුස් ආයතනය පත්ව තිබෙන ආර්ථික අර්බුදය හේතුවෙන් හඳුන්වා දුන් ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමය (VSR) යටතේ සේවකයන් 149 දෙනෙකු සේවයෙන් ඉවත් වී ඇත. ඉදිරි වසර තුළ තවත් 100 දෙනකු මේ ක්‍රමය යටතේ විශ්‍රාම ගැන්වීමට නියමිත බව ලේක්හවුස් පාලනාධිකාරිය ප්‍රකාශ කරයි. සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන පවත්වාගෙන යෑමට අසීරු තත්ත්වයකට පත්ව ඇති අතර වඩාත්ම බලපෑම එල්ල වී ඇත්තේ මුද්‍රිත මාධ්‍යයටය.

මූලාශ්‍රය: FMM-MFRM Desk

**6 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි - දෙසැම්බර් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි-නොවැම්බර් | | 2022 දෙසැම්බර් |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 64 | | 07 |
| නීතිමය කොන්දේසි | 100 | 25 | 05 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | 06 | | - |
| වෘත්තීයවේදීත්වය | 07 | | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 17 | 01 | 01 |
| **එකතුව** | **180** | **26** | **14** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-නොවැම්බර් මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවි සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


**Free Media Movement**

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995

Treasurer: Ananda Jayasekara +94 77 312 4850

No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;

Web: www.fmmsrilanka.lk, www.mediareform.lk

Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka

Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25


Layout: Nalinda Seneviratne